# පුංචි කුරුලු පැටියා



ඩී.එම්.විදුනි දහම්සා දිසානායක

# පුංචි කුරුලු පැටියා

ඩී.එම්.විදුනි දහම්සා දිසානායක
කතෘ

මප/ගම්/ජිනරාජ බාලිකා මහා විදුහල - ගම්පල
6 ශ්‍රේණිය
ප්‍රකාශිත දිනය 2025-02-08
ISBN 978-624-208-847-1

# පිදුම

මාගේ මෙම පොත සැකසීමේදී මා හට උදව් උපකාර කල මාගේ විදුහලේ විදුහල්පතිතුමියටත් සියලුම ගුරුභවතුන්ටත් මාගේ ආදරණීය දෙමාව්පියන්ටත් මාගේ ස්තූතිය පුදකරන අතර මාගේ සහොදර සහෝදරියන්ට මෙමෙ පොත කියවා රස විදින ලෙස කාරුණිකව ආරාධනා කර සිටිමි.



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එකදවසක මල්ලියි මමයි වත්ත පහළ ඇවිදින්න ගියා.අපි දෙන්නා ටිකක් දුර යනකොට වත්ත මැද ලොකුගහක් වැටිලා තිබුණා දුටුවා.අපි දෙන්නා එතන ටිකක් සෝදිසි කළා.



“අක්කා....එන්න” කියා මල්ලී මට කතා කළා.

“ඇයි,ඇයි මල්ලී?”

“අක්කේ ගහේ බෙනයක් තියනවා.”

“කෝ බලන්න මල්ලී.අත දාන්න එහෙම එපා...”

“අත දැම්මේ නෑ අක්කේ..මේ බලන්නකෝ අක්කේ මේ බෙනේ අස්සේ මොකෙද්දෝ දගලනවා”



“කෝ බලන්න,කෝ බලන්න මල්ලී,අනේ මේ පුංචි කුරුලු පැටියෙක් නේද මල්ලී”

“අනේ ඔව් අක්කේ,අපි මෙයාව ගෙදර අරගෙන යමු”

“එහෙනම් පරිස්සමට මේ කොළයට ගන්න මල්ලී..එයාගේ අම්මත් පේන්න නෑ වගේ..”

"අක්කේ අපි දැන් ගෙදර යමු”



ගෙදර ගෙනා කුරුලු පැටියා අපි පුලුන් ගොඩක් උඩ තැබුවා.අම්මාට සහ තාත්තාට කතා කලා..මමත් මල්ලීත් කුරුලු පැටියාට දීමට කිරි සාදාගෙන ඒමට ගියා.

අපගේ කෑගැසීමට බිය වී කුස්සියට දිව ආ අම්මා,

“මොකද මොකද දරුවෝ මේ කෑ ගහන්නේ මොනවද මේ හදන්නේ..”

“අම්මේ අපි මේ කුරුලු පැටියට දෙන්න කිරි ටිකක් හදනවා.”

“මොන කුරුලු පැටියද ළමයිනේ”

“අම්මේ මේ....මල්ලියි මමයි වත්ත පහළ ඇවිදිනකොට ගහක් වැටිලා තිබුණා.ඒ බෙනේ අස්සේ කුරුලු පැටියෙක් හිටියා.අපි දෙන්නා ඒ පැටියව ගෙදර ගෙනාවා.



“අනේ පුතේ මේ සතාගේ අම්මා හොයනවා ඇති..ගිහින් හිටපු තැනින්ම තියලා එන්න.”

“අනේ අම්මේ අපි ආසාවෙන්නේ ගෙනාවේ..”

“මේ බලන්න දරුවනේ ඔයාලා කැමතිද අම්මා,තාත්තාට නොකියා ඔයාලා දන්නේවත් නැති කෙනක් ඔයාලව අරගෙන යනවට.නෑ නේද?මේ සත්තු අයිති සොබාදහමට අපි එයාලා බලෙන් අයිතිකරගන්න එක කවදාවත් කරන්න හොද නෑ”

“හරි අම්මේ අපි කුරුලු පැටියා හිටපු තැනින්ම ගිහින් දාන්නම්”

මල්ලීත් මමත් කුරුලු පැටියා ආපසු ගස් බෙනයට ගිහින් දැම්මා.ටික වේලාවක් සැඟවී බලා සිටි අපි දෙදෙනාට කුරුලු පැටවාගේ මව ඌ අසලට පැමිණ සතුටින් පැටවා තුරුලුකරගත් ආකාරය දක්නට ලැබුණා.ඒ දෙස ටික වේලාවක් බලා සිටි මල්ලීත් මමත් සතුටින් ගෙදර ආවා..

නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් වයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් වයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්